සැ. යු. - 2023.12.29 දින පළ කරන ලද අංක 2365 *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,366 - 2024 ජනවාරි මස 05 වැනි සිකුරාදා - 2024.01.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 4 |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 6 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ජනවාරි මස 26 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජනවාරි 12 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1- B 82529— 5,403 (2024/01)

# පළාත් පාලන නිවේදන

## මහව ප්‍රාදේශීය සභාව

### ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය) යටතේ බලපත්‍ර ලබා දීමට එරෙහිව විරෝධතා කැඳවීම

මෙකී පහත උපලේඛනයන් හි සවිස්තරාත්මකව දක්වා ඇති ස්ථානයන් හි ගෝඝාතකාගාර පවත්වාගෙන යාම සඳහා 2024 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම සඳහා මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් මා වෙත දන්වා එවිය යුතු බව, ගෝඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරයේ 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

ආර්. ඩී. කේ. අමරජීව,
ලේකම් හා බලතල කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මහව ප්‍රාදේශීය සභාව.

මහව ප්‍රාදේශීය සභාව,
මහව ප්‍රදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය** 01

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම* | *ඝාතකාගාරය පවත්වාගෙන යන ස්ථානය* | *බලපත්‍රය වලංගු කාල සීමාව* |
|---|---|---|---|
| 01 | ආර්. එල්. ඉස්සදීන් | ඉහළ කීනපිටිය | 2024.01.01 සිට 2024.12.31 දක්වා |

01-07

---

## කොටපොල ප්‍රාදේශීය සභාව

### දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ නිවේදනය අවලංගු කිරීම

2023.06.23 දිනැති අංක 2338 දරන *රජයේ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරන ලද "කොටපොල ප්‍රාදේශීය සභාව - දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම" ශීර්ෂය යටතේ වූ නිවේදනය අවලංගු කිරීමට 2023.09.12 දින තීරණ අංක 2023/09/12/104 යටතේ තීරණය කළ වග මෙයින් මහජනතාව වෙත නිවේදනය කරනු ලැබේ.

එන්. එම්. දහනායක,
ලේකම්,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

01-13

---

## මිහින්තලේ ප්‍රාදේශීය සභාව

### ගෝ ඝාතක ආඥාපනතේ විධිවිධාන යටතේ බලපත්‍ර ලබා දීමට එරෙහිව විරෝධතා කැඳවීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් කරන ලද ස්ථානයෙහි 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කාලය තුළ ගවමස් අළෙවි සැලක් පහත උපලේඛනයේ සඳහන් ස්ථානයේ බදු දීමට නියමිතව ඇත. ඒ අනුව, 1893 අංක 09 දරන ගෝඝාතක ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව මිහින්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි යම් තැනැත්තෙකුට ඉහත ව්‍යාපාරයට විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමට

අවශ්‍ය නම්, එම කරුණු සඳහන් කර ලිඛිත ප්‍රකාශනයක් පිටපත් දෙකකින් යුතුව මෙම නිවේදනය පළ කරන ලද දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බවට උක්ත ආඥාපනතේ 07 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

පී. විජේසේන,
ලේකම්, බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මිහින්තලේ.

2023 දෙසැම්බර් මස 14 වැනි දින,
මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ දී ය.

**උපලේඛනය**

| *මස්කඩය පවත්වාගෙන යනු ලබන ස්ථානය* | *ස්වභාවය* |
|---|---|
| කනදරා කටුකැලියාව,<br>ඉහළගම,<br>මිහින්තලේ | ගවමස් අලෙවිය |

01-52/1

---

**මිහින්තලේ ප්‍රාදේශීය සභාව**

ගෝ ඝාතක ආඥාපනතේ විධිවිධාන යටතේ බලපත්‍ර ලබා දීමට එරෙහිව විරෝධතා කැඳවීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් කරන ලද ස්ථානයෙහි 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කාලය තුළ ගෝඝාතක ව්‍යාපාරයක් සඳහා පවත්වාගෙන යාමට මාගෙන් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව, 1893 අංක 09 දරන ගෝඝාතක ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව මිහින්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි යම් තැනැත්තෙකුට ඉහත ව්‍යාපාරයට විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම්, එම කරුණු සඳහන් කර ලිඛිත ප්‍රකාශනයක් පිටපත් දෙකකින් යුතුව මෙම නිවේදනය පළ කරන ලද දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බවට උක්ත ආඥාපනතේ 07 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

පී. විජේසේන,
ලේකම්, බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මිහින්තලේ.

2023 දෙසැම්බර් මස 14 වැනි දින,
මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම* | *ගෝඝාතක ව්‍යාපාර ස්ථානය* | *ස්වභාවය* |
|---|---|---|
| 1. එම්. එස්. අස්මි | කනදරා කටුකැලියාව,<br>ඉහළගම,<br>මිහින්තලේ | පුද්ගලික ගෝ ඝාතකාකාරයක් පවත්වාගෙන යාම |

01-52/2

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## රිදීගම ප්‍රාදේශීය සභාව

2022 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| | *සටහන්* | *20221.12.31 රු. ශත* | *2022.12.31 රු. ශත* |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 6 | 234,966,975.43 | 309,662,235.59 |
| ජංගම වත්කම් | | | |
| තොග | 7 | 1,605,431.89 | 3,342,583.00 |
| සේවක ණය හා අත්තිකාරම් | 8 | 7,750,924.33 | 9,358,963.33 |
| ලැබිය යුතු දෑ | 9 | 95,569,401.74 | 93,077,792.60 |
| ආයෝජන (පෙර ගෙවුම්) | 10 | 496,802.02 | 643,627.93 |
| ආයෝජන | 11 | - | 582,046.66 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 12 | 35,359,190.66 | 23,884,235.77 |
| වෙනත් | | 865,962.48 | - |
| මුළු වත්කම් | | 376,614,688.55 | 440,551,484.88 |
| වගකීම් | | | |
| ජංගම නොවන වගකීම් | 13 | 3,112,221.44 | 2,408,110.47 |
| ජංගම වගකීම් | 14 | 99,295,601.27 | 68,484,898.99 |
| හිමිකම් | 15 | 274,206,865.84 | 369,658,475.42 |
| මුල් හිමිකම් සහ වගකීම් | | 376,614,688.55 | 440,551,484.88 |

**2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය**

| | *සටහන්* | *2021.12.31 රු. ශත* | *2022.12.31 රු. ශත* |
|---|---|---|---|
| මෙහෙයුම් අයහාරය | | | |
| රජයේ දායකත්වය - පුනරාවර්තන | 1 | 53,964,732.60 | 74,866,115,06 |
| වෙනත් අයහාර | 2 | 41,720,657.02 | 4,809,343.36 |
| මුළු මෙහෙයුම් අයහාරය | | 95,685,389.62 | 124,675,458.42 |
| මෙහෙයුම් වියදම | | | |
| පුනරාවර්ථන වියදම | 3 | 82,568,149.63 | 103,214,505.50 |
| මුළු මෙහෙයුම් වියදම | | 82,568,149.63 | 103,214,505.50 |

| | සටහන් | 2021.12.31 රු. ශත | 2022.12.31 රු. ශත |
|---|---|---|---|
| වර්ෂය සඳහා වන මෙහෙයුම් අතිරික්තය/ඌණතාවය | | 13,117,239.99 | 21,460,952.92 |
| ප්‍රාග්ධන ලැබීම් | 4 | 209.038,891.42 | 0.00 |
| ප්‍රාග්ධන වියදම් | 5 | 218,218,173.13 | 18,046,546.91 |
| වර්ෂය සඳහා වන අතිරික්තය/ඌණතාවය | | 3,937,958.28 | 3,414,406.01 |

වී. එස්. එන්. තිලකරත්න,
ලේකම්,
රිදීගම ප්‍රාදේශීය සභාව.

01-48

---

## චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

### අයවැය ව්‍යාපෘති ප්‍රසිද්ධ කිරීම

වර්ෂ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ 3 වැනි උපවගන්තිය යටතේ ලබා දී ඇති බලතල අනුව, චාවකච්චේරි ප්‍රාදේශීය සභාවේ ලේකම් කදිර්කාමනාදන් සන්තිරකුමාර් වන මා, අදාළ ප්‍රාදේශීය සභා පනතේ 168 වගන්තිය අනුව චාවකච්චේරියේ 2024 මූල්‍ය වර්ෂයට අදාළ අයවැය ව්‍යාපෘතිය ප්‍රසිද්ධ කිරීම සඳහා 2023.12.12 වැනි දින කළමනාකරණ කමිටු තීරණය අනුව 2023.12.14 වැනි දිනැති අංක 480 පාලන නියෝගය යටතේ ම විසින් අනුමත කර ඇති පරිදි මෙයින් දන්වා සිටිමි.

**අයවැය ව්‍යාපෘති සාරාංශය**

| **අපේක්ෂිත ආදායම්** | රු. ශත |
|---|---|
| සභාවට හිමි ආදායම් | 106,789,110.00 |
| පරිත්‍යාග සහ ප්‍රතිපූර්ණ | 74,058,848.00 |
| වෙනත් ප්‍රාග්ධන ලැබීම් | 57,000,000.00 |
| අපේක්ෂිත මුළු ආදායම් | 237,847,958.00 |
| **වියදම්** | |
| පුනරාවර්තන වියදම් | 132,368,958.00 |
| ප්‍රාග්ධන වියදම් | 48,476,000.00 |
| වෙනත් ප්‍රාග්ධන වියදම් | 57,000,000.00 |
| අපේක්ෂිත මුළු වියදම් | 237,844.958.00 |
| ආදායම් අතිරික්ත | 3000.00 |

කේ. සන්තිරකුමාර්,
ලේකම්,
චාවකච්චේරි ප්‍රාදේශීය සභාව.

2023.12.19

01-08

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2024 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2024.01.05 | සිකුරාදා | 2023.12.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.01.12 | සිකුරාදා | 2023.12.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.01.19 | සිකුරාදා | 2024.01.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.01.26 | සිකුරාදා | 2024.01.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2024.02.02 | සිකුරාදා | 2024.01.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.09 | සිකුරාදා | 2024.01.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.16 | සිකුරාදා | 2024.02.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.22 | බ්‍රහස්පතින්දා | 2024.02.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2024.03.01 | සිකුරාදා | 2024.02.16 | සිකුරාදා | දහවල් | 03.00 |
| | 2024.03.07 | බ්‍රහස්පතින්දා | 2024.92.22 | බ්‍රහස්පතින්දා | දහවල් | 03.00 |
| | 2024.03.15 | සිකුරාදා | 2024.03.01 | සිකුරාදා | දහවල් | 03.00 |
| | 2024.03.22 | සිකුරාදා | 2024.03.07 | බ්‍රහස්පතින්දා | දහවල් | 03.00 |
| | 2024.03.28 | බ්‍රහස්පතින්දා | 2024.03.15 | සිකුරාදා | දහවල් | 03.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.